94b

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 1465/19 – 2006 ඔක්තෝබර් 05 වැනි බ්‍රහස්පතින්දා – 2006.10.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

ආණ්ඩුවේ නිවේදන

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත

3 වන වගන්තිය යටතේ නියෝග

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම මෙම නියෝග කරමි:

(අ) මෙහි උපලේඛනයේ I තීරුවේ යම් සටහනක දැක්වෙන යම් විශේෂිත සාධන පත්‍රයක් මත එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ දක්වා ඇති අනුප්‍රමාණයන්ට අනුව 2006.10.06 දින සිට ක්‍රියාත්මක වනසේ මුද්දර ගාස්තු අය කළ යුතු යයි නියම කරමි.

(ආ) එම වගන්තිය යටතේ සාදන ලද 2006 අප්‍රේල් 03 වැනි දින සහ අංක 1439/1 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලදුව 2006 අප්‍රේල් 20 වැනි දින සහ අංක 1441/17 දරන *ගැසට් නිවේදනය* මගින් එම වගන්තිය යටතේ සංශෝධිත නියෝග, 2006.10.06 දින සිට බලපැවැත්වෙන පරිදි පරිච්ඡින්න කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

[illegible] ඔක්තෝබර් මස 03 වැනි දින,
[illegible] ක්‍රමසම්පාදන [illegible]

උපලේඛනය

I තීරුව	II තීරුව රුපියල් ශත
[illegible] සම්බන්ධයෙන්	
[illegible]	25.00
[illegible] යුතු මුළු වාරික මුදලෙහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා	0.50
[illegible] බලකරුවෙකු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍රය	1,000.00

[illegible]

අයිතම අංකය	I තීරුව	II තීරුව රුපියල්
4.	යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රැකියාවක් කරගෙන යාමට නිකුත් කළ බලපත්‍රයක් - බලපත්‍රයකි සඳහා යම් කාලපරිච්ඡේදයක් සඳහා	1000.00 හෝ බලපත්‍ර ගාස්තුවෙන් 10% යන අගයන් දෙකෙන් අඩු වූ මුදල
5.	යම් කාලපරිච්ඡේදයක් තුළ යම් තැනැත්තෙකු (ක්‍රෙඩිට් කාඩ් [illegible]) ගනුදෙනුවක් සඳහා ගෙවිය යුතු මුළු හෝ [illegible] යම් මුදල් ප්‍රමාණයක් සඳහා නිකුත් කළ බිල්පතක් හෝ ලදුපතක් එම මුදලෙහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා	10.00
6.	යම් සමාගමක් යම් කොටස් [illegible] නිකුත් කිරීමේ [illegible] නිකුත් කළ යම් කොටස් සහතිකයක් එවැනි කොටස්වල මුද [illegible] සෑම රු. 1,000 [illegible]	[illegible]
7.	යම් දේපොළකට බලපාන යම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් [illegible] එහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසකට	1.00
8.	යම් පොරොන්දු නෝට්ටුවක් එහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා	1.00
9.	යම් දේපොළක් බද්දට හෝ කුලියට දීමට අදාළ යම් සාධන පත්‍රයක්	
	(අ) කල් බදු ගිවිසුම හෝ කුලී ගිවිසුම (කුලී සින්නක්කර ගිවිසුම් ඇතුළු නොව) යටතේ මුළු කාලපරිච්ඡේදය සඳහා යම් අවම මිල ද ඇතුළුව වාර්ෂික කල් බද්ද හෝ කුලියේ එහි සෑම රු. 1,000 හෝ ඉන් කොටසක් සඳහා	10.00
	එසේ වුවද කල් බද්දේ හෝ කුලියේ කාලපරිච්ඡේදය වසර 20 ඉක්මවන විට කල් බදු ගිවිසුම හෝ කුලී ගිවිසුම යටතේ කාලපරිච්ඡේදය සඳහා ගෙවිය යුතු කල් බද්ද හෝ කුලිය කල් බදු ගිවිසුම හෝ කුලී ගිවිසුමෙහි පළමු වසර 20 සඳහා වන කල් බද්ද හෝ කුලිය ලෙස සලකනු ලැබිය යුතුයි.	
	(ආ) 1982 අංක 20 දරන පාරිභෝගික ණය පනත යටතේ වූ මිලදී ගැනීමේ කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ ගෙවිය යුතු මුළු වටිනාකමෙහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා	10.00
10.	ලදුපත හෝ නිදහස් කිරීමක්	
	(අ) යම් මුදලක් හෝ ස්ථාවර දේපොළක් සඳහා දෙන ලද (මෙහි (ආ) ඡේදයේ සඳහන් පාරිශ්‍රමික ගෙවීම් හැර) රු. 1,000 ට සමාන හෝ ඊට වැඩි නමුත් රු. 50,000 ට අඩු මුදල් ප්‍රමාණය මත සෑම රුපියල් 1,000 හෝ ඉන් කොටසකට	1.00
	රු. 50,000 හෝ ඊට වැඩි මුදල් ප්‍රමාණය මත	50.00
	(ආ) සේවා නියුක්තියක් සඳහා ගෙවනු ලබන දළ පාරිශ්‍රමිකය	
	රු. 25,000 ට වැඩි නමුත් රු. 40,000 ට අඩු	25.00
	රු. 40,000 ට වැඩි නමුත් රු. 50,000 ට අඩු	40.00
	රු. 50,000 හෝ ඊට වැඩි	50.00

10-488

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.